# 01. ඔබගේ පත්වීමේ නෛතික ස්වභාවය

සමාදාන විනිශ්චයකාර පත්කිරීම් දෙවැදෑරුම්ය -

I. ගරු පත්වීම් (යහපත් සමාජ සේවාවක නිරත වූ පුද්ගලයින්ට සහ සමාජයේ සම්භාවනීය පුරවැසියන්ට)

II. නිල පත්වීම් (රාජකාරිමය අවශ්‍යතාවය මත අවශ්‍ය නීතිමය බලය ලබාදීමට ලබාදෙන පත්වීම්) මෙම පත්වීම්, නිලය දරන කාලය සඳහා පමණක් සීමා වේ. අධිකරණ සංවිධාන පනතේ 45 (1) වගන්තිය ප්‍රකාරව ලබා දේ. මෙසේ හිමිකම් ලබන තනතුරු නාමයෙන් එකී පනතේ 5 වන උපලේඛනයේ ඇතුළත් ව ඇත. (ඇමුණුම 1).

# 02. දිවුරුම්දීමේ කටයුතු

සමාදාන විනිශ්චයකාරවරයකු ලෙස පත්වීම ලැබූ ඔබගේ පත්වීම **දිවුරුම් දීමෙන් පසු** වලංගු වේ.

* අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අත්සනින් යුත් පත්වීම් ලිපිය හා එහි සහතික පිටපතක් හා ඔබගේ නම සඳහන් ගැසට් පත්‍රයේ පිටපතක් සමග අදාළ අධිකරණය (පත්වීම් ලිපියේ ඉහළ වම් කෙළවරේ අදාළ අධිකරණය සඳහන්ව ඇත) වෙත ගොස් රෙජිස්ට්‍රාර්තුමා/තුමිය හමුවිය යුතු වේ. එහිදී දිවුරුම් දීම සඳහා අවශ්‍ය ලියකියවිලි හා දිනයක් ඔබට ලබාගත හැකිය (මේ සඳහා කිසිදු අය කිරීමක් නැත).

* ඔබගේ පත්වීමට අදාළ ගැසට් පත්‍රය දැන ගැනීම සඳහා දුරකථන අංක 011- 2-437507-14 , 410 දිගුව මගින් සාම විනිසුරු අංශය අමතන්න. ඒ සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අත්සනින් යුත් පත්වීම් ලිපියේ අටවන ඡේදයේ සඳහන් ලියාපදිංචි අංකය අවශ්‍ය වේ. ඔබගේ පත්වීම ඔබ අතට පත්වන විටත් පත්වීමට අදාළ ගැසට් පත්‍රය නිකුත් වී තිබිය හැකි බැවින් ඒ සම්බන්ධයෙන් ඉහත අංකයෙන් විමසීම් කරන්න.

* ඔබගේ පත්වීමට අදාළ ගැසට් පත්‍රය සිකුරාදා දිනමිණ පුවත්පතෙන් ලබා ගත හැකි අතර, පහත ලිපිනයෙන් හා වෙබ් ලිපිනය මගින් රජයේ මුද්‍රණාලයෙන් අවශ්‍ය ගැසට් දින තොරතුරු ලබා ගත හැක.

**ගැසට් පත්‍රය මිලදී ගැනීම සඳහා:**

රජයේ ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
අංක 163, පොල්හේන්ගොඩ පාර,
කොළඹ 05.

**ගැසට් පත්‍රය අන්තර්ජාලයෙන් ලබා ගැනීම සඳහා පහත සඳහන් වෙබ් අඩවියට පිවිසිය යුතු වේ : –**
www.documents.gov.lk

***සැ. යු.-*** අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙනුවට අත්සන් කළ පත්වීම් ලිපියේ හා අදාළ ගැසට් පත්‍රයේ සඳහන් ඔබගේ නම, ලිපිනය, අධිකරණ කලාපය ආදියේ යම් වෙනසක් වේනොත් නිවැරදි කළ යුතු අන්දම පැහැදිලිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් හා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙනුවට අත්සන් කළ පත්වීම් ලිපියේ මුල් පිටපත ලියාපදිංචි තැපෑලෙන් නොපමාව පහත ලිපිනයට එවිය යුතු වේ :-

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
අධිකරණ මාවත, කොළඹ 12.



**දිවුරුම්දීමේ කටයුතු අවසන් කළ පසුව ඔබගේ සාමවිනිසුරු පත්වීම වලංගුතාවයට පත්වේ. අනතුරුව පහත දැක්වෙන කරුණු පිළිබඳව සැළකිලිමත් විය යුතු වේ :-**

* ඔබ සාම විනිසුරුවරයකු ලෙස රාජකාරි කිරිමට බලාපොරොත්තු වන ස්ථානයේ ඔබගේ නම, ලිපිනය, ලියාපදිංචි අංකය යොදා දැන්වීමක් ප්‍රදර්ශනය කිරිමට කටයුතු කරන්න.
* ඔබ සාම විනිසුරුවරයකු ලෙස පත්වීම ලබන්නේ අධිකරණ අමාත්‍යාංශයෙන් වන අතර, සාම විනිසුරු සංගම්වල සාමාජිකත්වය ලබාගැනීම සාම විනිසුරුවරයකු ලෙස ඔබගේ නිල කටයුතු සඳහා අත්‍යවශ්‍ය වන්නක් නොවේ. මෙවැනි සංගම්වල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අමාත්‍යාංශය වගකීමකට නොබැඳේ.
* දිවුරුම් දීමෙන් පසු ඔබගේ රාජකාරි කටයුතු ආරම්භ කළ හැකි ය.
* සාම විනිසුරු මියගිය විට ඒ සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශය දැනුවත් කිරිමට කටයුතු සකස්කර තිබිය යුතු ය.

## 03. නිල මුද්‍රාව සකස් කිරීමේ දී

01. නිල මුද්‍රාව සකස් කිරීමේදී නිල මුද්‍රාවේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු කරුණු :- (උපලේඛනය III)
    1. පත්වීම් ලිපියේ සඳහන් නමට සමානව නම
    2. පත්වීම් ලිපියේ සඳහන් ලිපිනය
    3. පත්වීම් ලිපියේ 8වන ඡේදයේ සඳහන් ලියාපදිංචි අංකය
02. රාජ්‍ය ලාංඡනය කිසි විටෙකත් තම නිල මුද්‍රාවට හෝ ලිපි ශීර්ෂවලට ඇතුළත් නොකළ යුතුය.
03. සාම විනිසුරු නිල මුද්‍රාවේ සාමවිනිසුරු ලියාපදිංචි අංකය හැර වෙනස් ලියාපදිංචි අංක නොයෙදිය යුතුය.
04. මෙතෙක් ලියාපදිංචි අංකයක් ලබාගෙන නොමැති නම් පත්වීම් ලිපියේ හා දිවුරුම හෝ ප්‍රතිඥවේ පිටපත් මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමෙන් පසු ලියාපදිංචි අංකයක් ලබාගත හැකිය. (2006 වර්ෂයට පසු පත්වීම් ලද සාම විනිසුරුවරුන් සඳහා මෙය වලංගු නොවේ).
05. ලිපිනය වෙනස් වී ඇත්නම් ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කරන ලද ග්‍රාම සේවක සහතිකයක් සමග ඒ බව අමාත්‍යාංශය වෙත දැන්විය යුතුය.

නිල මුද්‍රාව භාවිතා කිරීමේ දී -

* තම රාජකාරි ලිපි ලේඛනවලට පමණක් නිල මුද්‍රාව භාවිතා කළ යුතු වේ.
* පෞද්ගලික ලිපි සඳහා නිල මුද්‍රාව භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතු ය.
* අධිකරණ අමාත්‍යාංශය වෙත එවන සියලු ලිපි ලේඛනවල ඔබගේ සාම විනිසුරු නිල මුද්‍රාව අනිවාර්යයෙන් ම ඇතුළත් කළ යුතු ය.

## 04. සාම විනිසුරු හැඳුනුම්පත

* ඔබගේ සාම විනිසුරු පත්වීම සමග අමුණා ඇති (උපලේඛනය I) සාම විනිසුරු හැඳුනුම්පත නිකුත් කිරීමේ ආකෘතිය මැනවින්, කියවා බලා, පැහැදිලි අත් අකුරෙන් නිවැරදි ව සම්පූර්ණ කළ යුතු වේ.

* ඔබගේ සාම විනිසුරු හැඳුනුම්පත අස්ථානගත වී ඇත්නම් නව හැඳුනුම්පතක් ලබා ගැනීමට පහත දැක්වෙන අවශ්‍යතා සපුරා අධිකරණ අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් කළ යුතු ය.

1. සාම විනිසුරු පත්වීම් ලිපියේ පිටපතක්,
2. දිවුරුම/ප්‍රතිඥාවේ පිටපතක්,
3. පොලිස් පැමිණිල්ලේ පිටපතක්,
4. මි.මී. 40 x 40, වර්ණ ඡායාරූප 02ක් (ඉදිරිය බලා සිටින),
5. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,
6. රුපියල් 200ක මුදලක් පහත ගිණුම් අංකයට ගෙවා එහි ලදුපතේ මුල් පිටපත (අධිකරණ අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත ද මෙම ගෙවීම සිදු කළ හැකි ය).

**ගිණුම් අංකය :- 176 – 1- 001 – 9 - 9025184**



* ඔබගේ සාම විනිසුරු හැඳුනුම්පත අබලන් වී නැවත නිකුත් කළ යුතුව ඇත්නම් :

1. සාම විනිසුරු පත්වීමේ ලිපියේ පිටපතක්,
2. අබලන් වූ හැඳුනුම්පත,
3. මි.මී. 40 x 40, වර්ණ ඡායාරූප 02ක් (ඉදිරිය බලා සිටින)
4. රුපියල් 200ක මුදලක් පහත ගිණුම් අංකයට ගෙවා එහි ලදුපතේ මුල් පිටපත (අධිකරණ අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත ද මෙම ගෙවීම සිදු කළ හැකි ය).

**ගිණුම් අංකය : 176 – 1- 001 – 9 - 9025184**

සැ. යු. – 01. ඔබගේ පදිංචිය වෙනස් වී ඇත්නම් ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම සේවක සහතිකයක් මගින් නව ලිපිනය සනාථකර අප වෙත එවන්න.

02. සාම විනිසුරු අංශය මගින් නිකුත් කරන සාම විනිසුරු හැඳුනුම්පත කිසිදු අයුරකින් වෙනස් කිරීමක් නොකළ යුතු අතර, එය දඬුවම් ලැබිය හැකි වරදකි.

## 05. සාම විනිසුරුවරයකුගේ වගකීම්

* **අධිකරණ බල ප්‍රදේශය පිළිබඳ සැලකිලිමත් විය යුතු වේ**

ඔබට පත්වීම ලැබී ඇත්තේ මුළු දිවයින සඳහා ම නම්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කටයුතු කළ හැකි ය. ඔබගේ පත්වීම යම් අධිකරණ කලාපයක්/දිස්ත්‍රික්කයක් සඳහා ලබාදී ඇත්නම්, අදාළ අධිකරණ කලාපය/දිස්ත්‍රික්කය තුළ පමණක් කටයුතු කිරීමට සැළකිලිමත් විය යුතු ය.

* **රාජ්‍ය ලාංඡනය භාවිතා නොකිරීම**

කිසිවිටක රාජ්‍ය ලාංඡනය තම නිල මුද්‍රාවට හෝ ලිපි ශීර්ෂවලට හෝ වෙනත් ලේඛනයකට ඇතුළත් කිරීමෙන් වැළකී සිටිය යුතුය.

* **ලියවිලි සහතික කිරීමේ දී පුද්ගලයන් ඉදිරිපත් කරන විස්තර පිළිබඳ සැළකිලිමත් විය යුතු ය**

විවිධ පුද්ගලයින්ගේ ලියවිලි සහතික කිරීමේ දී ඔවුන් ඉදිරිපත් කරන තොරතුරු අසත්‍ය බව හැඟී ගියහොත් එම ලියකියවිලි සහතික කිරීමෙන් වැළකී සිටිය යුතු අතර, සෑම අවස්ථාවකදී ම අදාළ පුද්ගලයා ඉදිරියේ දී ම සහතික කිරීම කළ යුතු ය.

* **ගාස්තු අය කිරීම**

ඔබ ගරු තනතුරක් දරන බැවින් සිය සේවය වෙනුවෙන් කිසිදු මුදලක් අයකර ගැනීම හෝ වෙනත් ලාභයක් ලබා ගැනීම සපුරා තහනම් වේ.

* **නිල මුද්‍රාව භාවිතා කිරීම**

ඔබගේ සෑම රාජකාරි කටයුත්තක දී ම නිල මුද්‍රාව භාවිතා කළ යුතු අතර, නම, ලිපිනය සහ විනිසුරු ලියාපදිංචි අංකය නිවැරදිව අනිවාර්යයෙන් ම සඳහන් කළ යුතුය.

* **ඥාතීන්ගේ ලිපි ලේඛන සහතික කිරීම සම්බන්ධව**

සමීපතම ඥාතීන්ගේ ලිපි ලේඛන සාම විනිසුරුට සහතික කිරීම කළ නොහැකිය.

## 06. පෞද්ගලික හැසිරීම සහ ක්‍රියා කලාපය

1. I. පෞද්ගලිකව ඔබ සියළු දෙනාට ම ආදර්ශවත් විය යුතු ය. හැමවිට ම නිය තනතුරේ ගෞරවය රැකෙන ආකාරයට කටයුතු කළ යුතු ය. සේවය ලබා ගැනීමට පැමිණෙන පුද්ගලයින්ට විනීතව, ආචාරශීලීව ආමන්ත්‍රණය කළ යුතු ය.

   II. අපරාධ චෝදනා හා දඬුවම් ලැබීම සාමවිනිසුරු තනතුර අවලංගු කිරීමට හේතු වේ. එසේ ම දේශපාලන, වාර්ගික, ආගමික, කුල, ගෝත්‍ර භේදයකින් තොරව සෑම පුද්ගලයකුට ම සමානව සැළකිය යුතු ය.

(කලින් කල සංශෝධනය කරන ලද, 1895 අංක 09 දරන දිවුරුම් හා ප්‍රතිඥා ආඥාපනත, 1953 දිවුරුම් ප්‍රකාශ පනත, සිවිල් නඩු විධාන සංග්‍රහය හා අපරාධ නඩු විධාන සංග්‍රහය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන්න.)



2. ගැටුම්කාරි අවස්ථාවල දී අදාළ සියලු පාර්ශ්වයන්ගේ විශ්වාසය දිනාගත් පුද්ගලයෙකු විය යුතු ය.

3. සමාජ විරෝධී ක්‍රියාකාරකම් වැළැක්වීම හා අවම කිරීම සඳහා අදාළ නිලධාරින් සමග එක්ව කටයුතු කළ යුතු ය.

4. නීතිය ක්‍රියාවේ යොදවන පොලීසිය හා අධිකරණ වැනි ආයතනවල ක්‍රියාකාරීත්වය පහසු කරවන්නකු විය යුතු ය.

5. ස්වකීය සාම විනිසුරු පත්වීම අධිකරණ කලාපයකට ලැබී ඇත්නම් අධිකරණ කලාපයෙන් පිටතට ගොස් ලිපි ලේඛන සහතික කිරීම කටයුතු කළ නොහැක. එහෙත් දිවයින තුළ ඕනෑම පුද්ගලයෙකුට අධිකරණ කලාපය තුළට පැමිණ සහතිකකර ගැනීමට හැකිය.

6. තමා විසින් අත්සන් තබන සියලු ලිපි ලේඛන හා ලියකියවිලි සම්බන්ධයෙන් සටහන් තැබූ පැහැදිලි ලේඛනයක් ඔබ සතුව තිබිය යුතු අතර, දිවුරුම් ප්‍රකාශයක ආකෘතියක් ඔබගේ පහසුව හා දැන ගැනීම වෙනුවෙන් මෙහි උපලේඛනගත කර ඇත. (උපලේඛනය II)

* සාම විනිසුරුවරයකු ලෙස ඔබට මතුවන ගැටලුවල දී.

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය, කොළඹ 12.
යන ලිපිනයට ද,

දුරකථන අංක : 011-2-437507 සිට 12 දක්වා, දිගුව : සාම විනිසුරු අංශය, 410 අංකවලටට ද ඇමතිය හැකි ය.

***ශ්‍රී ලංකාව තුළ නීතිය, සාමය හා සමාජ සුබසිද්ධිය ගොඩනැංවීමෙහි ලා ඔබගෙන් ලැබෙන සේවාව අප ඉතා අගය කොට සළකන්නෙමු.***

## 07. උපලේඛන

*උපලේඛනය I*

මගේ අංකය : ආ/15/1/හැඳුනුම්පත්

සාම විනිසුරු අංශය,
අධිකරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.
20.../ ...../ ....දින

ගරු ස්වාමීන්වහන්ස/පූජකතුමනි/මහත්මයාණනි/මහත්මියණි,

**සාම විනිසුරු හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා උපදෙස් පත්‍රිකාව හා ඉල්ලුම්පත්‍රය**

මෙම හැඳුනුම්පත සඳහා අයදුම් කළ යුත්තේ තම පත්වීමෙහි දිවුරුම් දීමෙන් පසුව ය. (සාම විනිසුරු පත්වීම ගැසට් පත්‍රයේ පළ වී මාස 6ක් තුළ දිවුරුම්දීම අනිවාර්ය ය.)

02. ඔබගේ සාම විනිසුරු පත්වීමට අදාළ හැඳුනුම්පත නිකුත් කිරීම සඳහා දිවුරුම දීමෙන් පසු මෙහි පහත දක්වා ඇති අයදුම්පත නිසි පරිදි සම්පූර්ණකර පහත දක්වා ඇති ලේඛන ද සමග ඉහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ මෙම අමාත්‍යාංශයට පැමිණ හෝ භාරදිය හැකි බව කාරුණිකව දන්වා සිටිමු.

01. අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අත්සනින් යුතු පත්වීම් ලිපියේ ඡායා පිටපතක්.
(ගරු ඇමතිතුමාගේ අත්සනින් යුතු ආවරණ ලිපිය නොවේ).

02. මාස 06ක් ඇතුළත දී ලබාගත් මි.මී. 40 x 40 ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 02ක් (මෙම ඡායාරූපවල පසුපස ඔබගේ නම හා පත්වීම් ලිපියේ 08 වන ඡේදයේ සඳහන් ඔබගේ සාම විනිසුරු ලියාපදිංචි අංකය සඳහන් කළ යුතු වේ.)

03. මහජන බැංකුව, නගර මධ්‍ය ශාඛාව, කොළඹ 10 හි ගිණුම් අංක 176 – 1 – 001 – 9 – 9025184 දරන "අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් " ගිණුමට රු. 200ක මුදලක් බැරකර, එම බැරපත මේ සමග ඇමිණිය යුතු වේ. ( මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවීම සිදුකළ හැක.) මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

> * මෙම ගෙවීම මෙම අමාත්‍යාංශයේ ගිණුම් අංශයට ද සිදුකළ හැක.

04. දිවුරුම් දීමෙන් පසු අදාළ අධිකරණයෙන් ලබාදෙන දිවුරුම් ප්‍රතිඥාවේ පිටපතක්.

05. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.



> සැ. යු.
>
> * ඉහත දැ බහාලන ලිපි කවරයේ කෙළවරේ වම්පස " සාම විනිසුරු හැඳුනුම්පත් " යනුවෙන් සඳහන් කරන්න.
> * ඉහත අවශ්‍ය ලිපි ලේඛන අඩංගු නොවන සහ නිසි ලෙස පැහැදිලිව පහත පෝරමය සම්පූර්ණ නොකරන ඉල්ලුම්පත් පිළිබඳව කටයුතු කිරීම ප්‍රමාදවීමට ඉඩ ඇත.
> * ලිපිනය වෙනස් වී ඇත්නම්, පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම සේවා සහතිකයක් ඉදිරිපත් කරන්න.

මෙයට - විශ්වාසී,

.....................................
අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

(මෙතැනින් වෙන් කරන්න)

- - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - - -

**සාම විනිසුරු හැඳුනුම්පත ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය**

I. *සම්පූර්ණ නම* : ............................

II. *මුලකුරු සමග නම* : ............................

III. *ලිපිනය* : ............................

IV. *ජාතික හැඳුනුම්පත් අංකය* : ............................

V. *සාම විනිසුරු ලි.ප. අංකය* : ............................
*(පත්වීමේ ලිපියේ 08 වන ඡේදයේ පරිදි )*

.........................................
අත්සන.

දිනය : .....................

# දිවුරුම් ප්‍රකාශයක ආකෘතියක්

## දිවුරුම් ප්‍රකාශයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, පිළියන්දල, මොරටුව පාරේ, අංක 142/6 දරන ස්ථානයේ පදිංචි චන්ද්‍රාවතී සතරසිංහ වන මම, බෞද්ධාගමිකාරියක වශයෙන් ගෞරව බහුමානයෙන් යුක්තව ද, අවංකව ද, සත්‍ය ලෙස ද ප්‍රතිඥා දී මෙහි පහත සඳහන් පරිදි ප්‍රකාශ කරමි.

1. මෙම දිවුරුම් ප්‍රකාශයේ ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක මම වෙමි.
2. මාගේ ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය 372667550 V
3. මාගේ පුත්‍රයා වන ගයාන් විජයන්ත යන අය විසින් මා හට ඇටෝර්නි බලය පවරමින් ඇටෝර්නි බලපත්‍රයක් 2005 ජූලි මස 23 වැනි දින පිළියන්දල දී අත්සන් කරන ලද අතර, එම බලපත්‍රයේ අංකය 266 වේ.
4. එම ඇටෝර්නි බලපත්‍රය 2007 අගෝස්තු මස 06 වැනි දින රජයේ ලියාපදිංචි කර ඇත.
5. එකී අංක 266 දරන ඇටෝර්නි බලපත්‍රය අද දක්වා ම වලංගුව පවතින අතර, කිසිවිටෙක එය අවලංගුකර නැත.

...............................................

දිවුරුම් ප්‍රකාශක.

(දිවුරුම් ප්‍රකාශක විසින් රු. 50ක මුද්දර මත අත්සන් තැබීම අනිවාර්ය-වේ.)

ඉහත සඳහන් ප්‍රකාශය කියවා තේරුම් කර දෙන ලදුව, ඇය විසින් එකී කරුණු තේරුම්ගත් බවට සෑහීමකට පත්වීමෙන් 2007 සැප්තැම්බර් මස 28 වැනි දින කොළඹ දී මා ඉදිරිපිට දී ස්වකීය අත්සන යොදන ලදී.

...............................................

සමාදාන විනිශ්චයකාර
(නිල මුද්‍රාව)

* සැ. යු.- දිවුරුම් ප්‍රකාශනයකට තැබිය යුතු මුද්දර ගාස්තුව කලින් කලට වෙනස් විය හැකි ය.





# නිවැරදි නිල මුද්‍රාවක ආකෘතියක්

ඔබගේ පත්වීම් ලිපියේ නම : සමරසිංහ මුදියන්සේලාගේ අශෝක නන්දන විජේවික්‍රම සමරසිංහ නම්, එස්.එම්.ඒ.එන්.ඩබ්. සමරසිංහ හෝ එස්.එම්.ඒ. නන්දන විජේවික්‍රම සමරසිංහ ලෙස නිල මුද්‍රාවේ සඳහන් කළ යුතු ය.

ඔබගේ ලිපිනය : ලිපිනය අංක 4, නව මාවත, අතුරුගිරිය නම් ද,

ඔබගේ ලියාපදිංචි අංකය : පත්වීම් ලිපියේ 8 වන ඡේදයේ සඳහන් ලියාපදිංචි අංකය 10/07/බප/මුදි/23 නම් ද,

එස්. එම්. ඒ. එන්. ඩබ්. සමරසිංහ
සාම විනිසුරු
අංක 4, නව මාවත, අතුරුගිරිය
10/07/බප/මුදි/23

**S. M. A. N. W. Samarasinghe**
**Justice of Peace**
**No.4, Nawa Mw., Athurugiriya**
10/07/WP/WI/23

*ඇමුණුම අංක 1*

## නිල බලයෙන් පත්වන ශ්‍රී ලංකාවේ සමාදාන විනිශ්චයකාරවරුන්

* ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා
* පාර්ලිමේන්තුවේ කතානායකවරයා
* රාජ්‍ය අමාත්‍යවරයා
* අග්‍ර විනිශ්චයකාරවරයා
* විරුද්ධ පක්ෂයේ නායකවරයා
* ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයා
* අභියාචනාධිකරණයේ සභාපතිවරයා
* අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්
* නියෝජ්‍ය කථානායකවරයා
* ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා
* නියෝජ්‍ය අමාත්‍යවරුන්
* නියෝජ්‍ය කාරක සභාපතිවරයා
* පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෝ
* නීතිපතිවරයා
* අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා
* ජනාධිපතිවරයාගේ ලේකම්වරයා
* අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා
* පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා
* විවිධ අමාත්‍යාංශවල ලේකම්වරුන්
* මහාධිකරණයේ විනිශ්චයකාරවරුන්
* පොලිස්පතිවරයා
* නියෝජ්‍ය නීතිපතිවරයා



* විවිධ අමාත්‍යාංශවල අතිරේක ලේකම්වරුන්
* නීති කෙටුම්පත් සම්පාදක
* අල්ලස් කොමසාරිස්වරයා
* අතිරේක නියෝජ්‍ය නීතිපතිවරයා
* අතිරේක නීති කෙටුම්පත් සම්පාදක
* මහා භාරකාරවරයා
* රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා
* උප නීතිපතිවරුන්
* විවිධ අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන්
* පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්වරයා
* ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා
* අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා
* නියෝජ්‍ය පොලිස්පතිවරුන්
* ජ්‍යෙෂ්ඨ රජයේ නීතිපතිවරුන්
* රජයේ නීතිඥවරුන් හා විවිධ අමාත්‍යාංශවල සහකාර ලේකම්වරුන්
* ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා ; සහ
* අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා
* පොලිස් අධිකාරිවරුන් සහ ආධුනික සහකාර පොලිස් අධිකාරිවරුන් නොවන සහකාර පොලිස් අධිකාරිවරුන්
* මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයා
* පාර්ලිමේන්තුවේ සභානායකවරයාගේ ලේකම්වරයා
* පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ ලේකම්වරයා
* කම්කරු විනිශ්චය අධිකාරිවල ලේකම්වරයා

## නීල බලයෙන් පත්වන ශ්‍රී ලංකාවේ කොටස් සඳහා සමාදාන විනිශ්චයකාරවරුන්

* දිසා අධිකරණයේ විනිශ්චයකාරවරුන්
* එක් එක් පවුල් අධිකරණ විනිශ්චයකාරවරුන්
* මහෙස්ත්‍රාත්වරුන්
* එක් එක් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරුන්
* එක් එක් කම්කරු විනිශ්චය අධිකාරියේ සභාපතිවරයා
  යන අය තම අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන්නේ යම් ප්‍රදේශයක් තුළ ද, ඒ සඳහා ද, දිසා අධිකරණයන් හි අධිකරණ බල සීමා තුළ කටයුතු කරන කාතිවරුන් ඒ දිස්ත්‍රික්ක සඳහා ද, සාමදාන විනිශ්චයකරුවෝ ලෙස ක්‍රියා කරති.
* තව ද, දිසා අධිකරණයන් හි අධිකරණ බල සීමා තුළ පදිංචිව සිටින කාතිවරු ඒ දිස්ත්‍රික්ක සඳහාත්,
* දිසා අධිකරණයන් හි අධිකරණ බල සීමා තුළ පදිංචිව සිටින කාති මණ්ඩලවල සාමාජිකයන් ඔවුන් පදිංචිව සිටින ඒ දිස්ත්‍රික්ක සඳහාත්,
* යම් කලාපයක පවත්වනු ලබන මහාධිකරණයේ අතිරේක රෙජිස්ට්‍රාර්වරුන් සහ කම්කරු විනිශ්චය අධිකාරිවල, ඒ ඒ කලාපය ඇතුළත්, දිසා අධිකරණවල, පවුල් අධිකරණවල රෙජිස්ට්‍රාර්වරුන් සහ කම්කරු විනිශ්චය අධිකාරිවල සහකාර ලේකම්වරුන් ඒ ඒ අධිකරණවල හෝ කම්කරු විනිශ්චය අධිකාරිවල අධිකරණ බල සීමාව සඳහාත්,
* පරිපාලන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන් තම තමන් සේවය කරන පරිපාලන දිස්ත්‍රික්ක සඳහාත්,
* පරිපාලන දිස්ත්‍රික්කවල අතිරේක ලේකම්වරුන් තම තමන් සේවය කරන ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්ක සඳහාත්,
* පරිපාලන දිස්ත්‍රික්කවල ලේකම්වරුන්ගේ පරිපාලන නිලධරයෝ ඒ ඒ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ දිස්ත්‍රික්ක සඳහාත්,
* ප්‍රාදේශීය ලේකම්වරුන් තම තමන්ගේ ඒ ඒ බල සීමා ප්‍රදේශ සඳහාත්,



* 1991 අංක 29 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත ප්‍රකාරව පළාත් සභා සියලු මන්ත්‍රීවරුන් අදාළ ප්‍රදේශ සඳහාත්, මහ නගර සභාවල හා නගර සභාවල සභායකයන් අදාළ බල ප්‍රදේශ සඳහාත්, ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සෙසු සභායකයන් ද තමන්ගේ අදාළ බල ප්‍රදේශ සඳහා නීල බලයෙන් සාමදාන විනිශ්චයකරුවන් ලෙස කටයුතු කරනු ලැබේ.

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වන වගන්තියේ 1(අ) වන උපවගන්තියට අනුව අධිකරණ අමාත්‍යතුමා විසින් සාදන ලද නියෝග අනුව නීල බලයෙන් පත්වන සාම විනිසුරුවරුන්.

### නීල බලයෙන් පත්වන ශ්‍රී ලංකාවේ සමාදාන විනිශ්චයකාරවරුන්

* දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
* දේශීය ආදායම් කොමසාරිස්වරු
* නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරු
* සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරු
* මහා භාරකාර දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි

### නීල බලයෙන් පත්වන ශ්‍රී ලංකාවේ කොටස් සඳහා සමාදාන විනිශ්චයකාරවරුන්

* ඉඩම් රෙජිස්ට්‍රාර්වරු
* අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරු
* උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර්වරු
* මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරු .

(ඔවුන්ගේ ඒ ඒ පත්වීම අදාළ වන්නේ කවර ප්‍රදේශවලට ද, ඒ ප්‍රදේශ ඇතුළත් වන ප්‍රදේශ.)

* ග්‍රාම නිලධාරිවරු